ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | CSS/7/1/9 | ඔබේ අංකය / உமது இல. / Your No. | | දිනය / திகதி / Date | 2016.12.27 |

## ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 03/2016 (1)

දකුණු පළාත් සභාවේ,

ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් හා

ගණන් දීමේ නිලධාරීන් වෙත.

## ප්‍රසම්පාදන කමිටු සීමාවන් සංශෝධනය කිරීම.

2016.05.25 දින අමාත්‍ය මණ්ඩල තීරණ අංක 737 මගින් පළාත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය හා ආණ්ඩුකාර ලේකම්ගේ අංක G/SP/6/4/2 -2 හා 2016.08.23 දිනැති ලිපිය මගින් ලැබී ඇති ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය පරිදි නිකුත්කරන ලද ප්‍රසම්පාදන කමිටු සීමා සංශෝධනයට අදාල 2016.08.24 දිනැති ප්‍රධාන ලේකම් චක්‍රලේඛ(මුදල්) 03/2016 ට අතිරේක වශයෙනි.

පළාත් දෙපාර්තමේන්තු හා ප්‍රාදේශීය ආයතන මගින් ඉටුකරනු ලබන කාර්යයන් වඩාත් කාර්යක්ෂමව ඉටුකරගැනිම සඳහා එම චක්‍රලේඛය මගින් සංශෝධනය කරන ලද ප්‍රසම්පාදන කමිටු සීමාවන් යටතේ පහත සඳහන් බල අධිකාරී සීමාවන්ද ඇතුලත් කිරීම 2016.10.13 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අංක750 මගින් පළාත් අමාත්‍ය මණ්ඩලය අනුමත කර ඇති අතර, ඒ සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ආණ්ඩුකාර ලේකම්ගේ G/SP/6/8-2 හා 2016.12.20 දිනැති ලිපිය _මගින් ලැබී ඇත.

එබැවින් පහත සඳහන් ප්‍රසම්පාදන කමිටු සීමා අනුව ඔබ අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ ප්‍රසම්පාදන කටයුතු සිදුකරන ලෙසත්, මෙහි සඳහන් නියමයන් හා උපදෙස් පිළිපදින ලෙසත්, කාරුණිකව දන්වමි. මේ සම්බන්ධයෙන් ඔබ අමාත්‍යාංශයට/ දෙපාර්තමේන්තුවට අයත් සියළුම ආයතන දැනුවත් කරන ලෙසද වැඩිදුරටත් දැනුම්දෙමි.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 2232343
කාර්යාලය / காரியாலயம் / Office 091 2234052, 091 2226118
ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299
විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இ தளம் / Web site www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.
"විශිෂ්ටත්වයෙන් ① ට එන යහපාලනයක්"

422.1.ආ.- භාණ්ඩ , වැඩ සහ උපදේශක සේවා නොවන සේවා ප්‍රසම්පාදනය සඳහා වෙළඳ පොළ මිල සැඳහුම් ක්‍රමය අනුගමනය කිරීමේදී (ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.4)

| බල අධිකාරිය හා කැඳවිය යුතු අවම මිළ ගණන් ප්‍රමාණය. | ශ්‍රී ලංකා රජයේ අරමුදල් සපයන ව්‍යාපෘති | විදේශ අරමුදල් සපයන ව්‍යාපෘති |
|---|---|---|
| 16. පළාත් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව - ඉදිකිරීම් වැඩ/භාණ්ඩ හා උපදේශක සේවා නොවන සේවා (මුද්‍රා තබන ලද මිළ ගණන් 3 ට නොඅඩුව කැඳවීමෙන් හා ප්‍රසිද්ධ විවෘත කිරීමෙන්) | රු.500,000 දක්වා | |
| 17. ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව - ඉදිකිරීම් වැඩ/භාණ්ඩ හා උපදේශක සේවා නොවන සේවා (මුද්‍රා තබන ලද මිළ ගණන් 3 ට නොඅඩුව කැඳවීමෙන් හා ප්‍රසිද්ධ විවෘත කිරීමෙන්) | රු .250,000 දක්වා. | |
| 18. ගණන්දීමේ නිලධාරින්/ දෙපාර්තමේන්තු ප්‍රධානීන් - ඉදිකිරීම් වැඩ/භාණ්ඩ හා උපදේශක සේවා නොවන සේවා (මුද්‍රා තබන ලද මිළ ගණන් 3 ට නොඅඩුව කැඳවීමෙන් හා ප්‍රසිද්ධ විවෘත කිරීමෙන්) | . රු. 250,000 දක්වා. | |

ආර්.සී.ද සොයිසා,

ප්‍රධාන ලේකම් ,

දකුණු පළාත.

පිටපත් - 1. සහකාර විගණකාධිපති - දකුණු පළාත - දැ.ගැ.ස

2 අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ - දැ.ගැ.ස

3. ගිණුම් හා ගෙවීම් අධ්‍යක්ෂ - දැ.ගැ.ස